**රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව - 2016**

**------------------------------------------**

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ ( "බැංකුව") 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, විස්තීරණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති හා අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන , 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1975 අංක13 දරන රාජ්‍ය උකස් ආයෝජන බැංකු පනතේ 65(2) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. මුදල් පනතේ 14 (2)(සී) වගන්තිය ප්‍රකාරව බැංකුවේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම

**---------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය යැයි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කරනු ලබන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ ("අධ්‍යක්ෂ මණ්ඩලය") වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

**--------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළ වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස බැංකුවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් බැංකුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

## 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2 .2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (ශ්‍රීලංගිප්‍ර / ශ්‍රීලංවාප්‍ර ) වලට අනුකූල වීම

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 08 –"ගිණුම්කරණ ප්‍රතිපත්ති, ඇස්තමේන්තුවල වෙනස්වීම් හා වැරදි" වලට අනුගත නොවන ආකාරයෙන්, 2015 වර්ෂයට පෙර වර්ෂ වලට අදාළ වැරදි නිවැරදි කිරීම් ලෙස විශේෂිත ගෙවීම් මත රඳවා ගත් බදු ගිණුමට, පිළිවෙලින් රු.124,707 ක් හා රු.3,317,349 ක් හර සහ බැර සටහන් බැංකුව තබා තිබුණි.

### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට (ශ්‍රීලංගිප්‍ර / ශ්‍රීලංවාප්‍ර) අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරනු ලැබ ඇතත්, මූල්‍ය ප්‍රකාශනවල පෙන්නුම් කරන ශේෂ පිළිබිඹු වන පරිදි පොදු ලෙජර් ගිණුම් යාවත්කාලීන කර නොතිබුණි. එම නිසා, මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම වෙනුවෙන්, වාර්තා කරන කාලච්ඡේදයට පසුව ගැලපීම් ලෙස පොදු ලෙජරයට රු.484,816,298 ක් වටිනා සටහන් 19 ක් තැබීමට බැංකුවට සිදුව තිබුණි.

(ආ) 2016 ජනවාරි 01 දිනට මූල්‍ය ප්‍රකාශනවල නොසැසඳු පාලන ගිණුමක් ලෙස රු. 8,614,361 ක වටිනාකමක් දක්වා තිබුණි. සමාලෝචිත වර්ෂය තුළ මෙම ගිණුමට පිළිවෙලින් රු.58,137,838 ක් හා රු.42,526,685 ක් හර හා බැර කර ඇතත්, මෙම හර සහ බැර සටහන්වලින් බොහොමයක් ඉකුත් වර්ෂවලට අදාල අතර ඒ සඳහා ප්‍රමාණවත් තොරතුරු නොපැවතුණි. ඒ අනුව, මූල්‍ය ප්‍රකාශනවල වෙනත් වත්කම් යටතේ දක්වා ඇති රු.24,225,514 ක හර ශේෂයේ නිවැරදිතාවය හා අයකර ගත හැකි බව සැක සහිත විය.

(ඇ) 2016 දෙසැම්බර් 31 දිනට උපලබ්ධි වන තෙක් චෙක්පත් ගිණුමේ තහවුරු කිරීමකින් තොරව පවතින රු.12,407,870 ක අසාමාන්‍ය හර ශේෂයක් පැවතුණි. එබැවින්, මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වෙනත් ණය ගැතියන් එම ප්‍රමාණයෙන් වැඩිපුර දක්වා තිබුණි.

(ඈ) 2016 වර්ෂයට හා ඊට පෙර වර්ෂවලට අදාලව බැංකු සැසඳුම් ප්‍රකාශනයන්ට කළ යුතු එකතුව රු.5,020,135 ක ගැලපීම් අදාල බැංකු සැසඳුම් ප්‍රකාශනයන්ට කර නොතිබුණි. එබැවින්, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල පෙන්නුම් කරන මුදල් හා මුදල් සමාන දෑ එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන අනුව, ණය ගිණුම්වලට වෙන් නොකළ ණය ශේෂය රු.168,317,332 කි. කෙසේ වුවද, වයස් විශ්ලේෂණයේ එය රු. 148,743,268 ක් ලෙස පෙන්නුම් කෙරිණි. එබැවින්, 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වෙනත් වගකීම් රු.19,574,064 කින් වැඩියෙන් දැක්වුණි.

## 2.2.3 පැහැදිලි නොකළ වෙනස්කම්

----------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2016 දෙසැම්බර් 31 දිනට ණය වර්ග 04 කට අදාල ණය ලේඛන හා පොදු ලෙජරයේ දැක්වෙන ණය ශේෂ අතර රු.3,265,669 ක වෙනසක් නිරීක්ෂණය වූ අතර එම වෙනස සඳහා හේතුව විගණනයට පැහැදිලි නොකෙරිණි. එසේම, හානිකරණය සඳහා සැලකිල්ලට ගත් හා නොගත් මුළු ණය වටිනාකම (ණය එකතු කිරීමෙන් පසු) සහ මූල්‍ය ප්‍රකාශනවලට අනුව ණය වටිනාකම අතර රු.1,382,385 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ආ) 2016 දෙසැම්බර් 31 දිනට නොසසඳන ලද අන්තර් ශාඛා ගිණුම් අතර රු.2,856,831 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඇ) 2016 දෙසැම්බර් 31 දිනට සේවක අර්ථ සාධක හා සේවක භාරකාර ප්‍රේෂණ පත්‍රවල පෙන්වන ගෙවිය යුතු වටිනාකම සහ මූල්‍ය ප්‍රකාශනවල පෙන්වන වටිනාකම අතර රු.2,213,095 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඈ) මූල්‍ය ප්‍රකාශනවල උප ලේඛනයේ සේවක සුක්ෂිත තැන්පතු ලෙස දැක්වෙන රු.1,587,771 ක වටිනාකම, 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශවල දැක්වෙන රු.1,729,042 ක අනුරූප ශේෂයෙන් වෙනස්වූ බැවින් විගණනයේදී රු.141,271 ක පැහැදිලි නොකළ වෙනසක් නිරීක්ෂණය විය.

(ඉ) 2016 දෙසැම්බර් 31 දිනට තැන්පතුවලට අදාල පරිගණක පද්ධතියෙන් ලබා ගත් ශේෂ සහ මූල්‍ය ප්‍රකාශන අතර රු.539,171 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඊ) බැංකුව විසින් අනුගමනය කරනු ලබන ගිණුම්කරණ ක්‍රමය අනුව, ශාඛා නිවේදන හා ඉල්ලීම් වවුචර් ගිණුමේ පිළිවෙලින් බැර ශේෂයක් හා හර ශේෂයක් පෙන්නුම් කළ යුතු වුවත්, 2016 දෙසැම්බර් 31 දිනට පිළිවෙලින් රු.6,571,060 ක හා රු. 17,592,805 ක අසාමාන්‍ය හර හා බැර ශේෂ නිරීක්ෂණය විය. කෙසේ වුවද, විගණනයට මේ සඳහා හේතු පැහැදිලි කර නොතිබුණි.

(උ) බදු බලපෑම ලෙස මූල්‍ය ප්‍රකාශනවල රු.27,884,783 ක වටිනාකමක් පෙන්නුම් කළද, විගණනයට සපයන ලද ලේඛන අනුව, එය රු.493,558 ක් විය. වෙනස වූ රු.27,391,225 ක් 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල ගලපා නොතිබුණි.

## 2.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

---------------------------------------

සමාලෝචිත වර්ෂය අවසානයට වෙනත් ණය ගැතියන් යටතේ වංචා ගිණුම ලෙස දක්වා ඇති රු.2,400,000 ක වටිනාකමක්, විස්තරාත්මක ලේඛන, තහවුරු කිරීම් හා වෙනත් අවශ්‍යා විස්තර විගණනයට සපයා නොදීම හේතුවෙන් සතුටු දායක ලෙස සන්නිරීක්ෂණය කළ නොහැකි විය.

**2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වර්ෂ දෙකකටත් වඩා වැඩි කාලයක් මූල්‍ය ප්‍රකාශනවල කලින් ලැබූ ලෙස රු.1,389,087 ක වටිනාකමක් දැක්වුණි. කෙසේ වුවද, සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් මෙම ශේෂ නිරවුල් කර නොතිබුණි.

(ආ) වර්ෂ දෙකකටත් වඩා වැඩි කාලයක් තිස්සේ එකතුව රු.2,121,389 ක් වූ පහත ගිණුම් ශේෂයන් අයකර ගැනීමකින් තොරව ඉදිරියට ගෙන ගොස් තිබුණි.

| **ගිණුමේ නම** | **වටිනාකම (රු.)** |
|---|---|
| අයකරගතයුතු ස්ථාවර තැන්පතු ණය | 418,635 |
| ජාතික ආරක්ෂක බද්ද | 785,954 |
| කලින් ගෙවූ පොළී ( ආශ්චර්යා) | 916,800 |
| **එකතුව** | **2,121,389** |

(ඇ) අත්තිකාරම් ගිණුම්වල පවතින රු.7,197,693 ක හර ශේෂයෙන්, 2015 වර්ෂයට අදාල එකතුව රු.5,376,153 ක් හඳුනාගෙන ගිණුම්වල ගැලපීම් කර නොතිබුණි. එබැවින් මෙම ශේෂයේ අයකරගත හැකි බව හා විශ්වාසනීය බව විගණනයේදී තහවුරු කළ නොහැකි විය.

(ඈ) අර්ථසාධක අරමුදල් ගිණුමට උපචිත ලෙස වෙනත් ණයගැතියන් යටතේ රු. 1,518,610 ක හර ශේෂයක් දක්වා ඇති බව නිරීක්ෂණය විය. මෙම ශේෂය අදාල පාර්ශවයන් විසින් තහවුරු කර නොතිබූ නිසා, මෙම ශේෂයේ අය කර ගත හැකි බව සැකසහිත විය.

(ඉ) 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල අවිනිශ්චිත ස්වභාවයේ පවතින රු.799,884 ක වටිනාකමක් වෙනත් ණය ගැතියන් යටතේ දක්වා තිබුණි. කෙසේ වුවද, මෙහි විස්තර හා ඊට හේතු විගණනයට සපයා නොතිබුණි.

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා බැංකුවේ මෙහෙයුම් වලින් වූ ප්‍රතිඵලය රු. මිලියන 706 ක බදු පෙර ශුද්ධ ලාභයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ බදු පෙර ශුද්ධ ලාභය රු. මිලියන 681 ක් වූයෙන් සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිඵලයේ රු. මිලියන 25 ක හෙවත් සියයට 4 ක වර්ධනයක් දැක්වුණි.

ඉකුත් වර්ෂයේ අනුරූප අගයන්වලට සාපේක්ෂව, පොළී ආදායම සියයට 9.3 කින් වැඩි වීම හා හානිකරණ වියදම සියයට 67 කින් අඩු වීම මෙම වර්ධනය සඳහා බලපෑ ප්‍රධාන හේතු විය.

**3.2 එකතු කළ අගය**

සමාලෝචිත වර්ෂය සඳහා බැංකුවේ මූල්‍ය ප්‍රතිඵලය රු.436,017,785 ක් වුවද, සමාලෝචිත වර්ෂය සඳහා එකතුව රු.1,226,236,833 ක සේවක පාරිශ්‍රමික, ක්ෂය වීම් හා රජයට ගෙවිය යුතු බදු සැලකිල්ලට ගත් පසු බැංකුවේ එකතු කළ අගය 2013 වර්ෂයේ රු.933,770,458 සිට 2016 වර්ෂයේ රු.1,662,254,618 ක් දක්වා ක්‍රමිකව වැඩි වී තිබුණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව රු.86,232,972 කින් හෙවත් සියයට 5.5 කින් බැංකුවේ මුළු එකතු කළ අගය වැඩි වී තිබුණි.

## 3.3 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

### 3.3.1 ලාභදායිත්වය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

i. 2011-2016 කාල පරිච්ඡේදය තුළදී පොළී ආදායම රු. මිලියන 2,611 සිට රු. මිලියන 4,241 දක්වා සියයට 62.4 කින් ඉහල ගොස් තිබුණු අතර පොළී වියදම 2011 සිට 2016 දක්වා රු. මිලියන 1,214 සිට රු. මිලියන 2,425 දක්වා සියයට 99 කින් වැඩි වී තිබුණි. ඒ අනුව, ශුද්ධ පොළී ආදායම 2011 වර්ෂයේ පැවති සියයට 53.5 සිට 2016 වර්ෂයට සියයට 42.8 ක් දක්වා සියයට 11 කින් පහත බැස තිබුණි.

ii. 2011-2016 කාල පරිච්ඡේදය තුළදී බදු පසු ශුද්ධ ලාභය රු. මිලියන 510 සිට රු. මිලියන 436 දක්වා සියයට 14.5 කින් පහත බැස තිබුණි. කෙසේ වුවද, ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේදී එය රු. මිලියන 409 සිට රු. මිලියන 436 දක්වා සියයට 6.6 කින් වැඩි වී තිබුණි.

### 3.3.2 වැදගත් ගිණුම්කරණ අනුපාත

ලබා ගත හැකි වූ තොරතුරු අනුව, බැංකුවේ සමාලෝචිත වර්ෂයේ සහ ඉකුත් වර්ෂ දෙකක වැදගත් ගිණුම්කරණ අනුපාත කිහිපයක් ආංශික අනුපාතයන් සමඟ සසඳා පහත දැක්වේ.

| | | බැංකුව | | ආංශික අනුපාත (බලපත්‍රලාභී විශේෂිත බැංකු) | |
|---|---|---|---|---|---|
| | | **2016** | **2015** | **2016** | **2015** |
| | | **ප්‍රතිශතය** | **ප්‍රතිශතය** | **ප්‍රතිශතය** | **ප්‍රතිශතය** |
| | <u>ලාභදායී අනුපාත</u> | | | | |
| i. | ශුද්ධ පොළී ආන්තිකය | 5.36 | 5.81 | 3.5 | 3.8 |
| ii. | ස්කන්ධය මත ප්‍රතිලාභය (ROE) | 9.50 | 9.90 | 18.3 | 20.3 |
| iii. | වත්කම් මත ප්‍රතිලාභය(ROA) | 2.03 | 2.11 | 1.5 | 1.6 |
| iv. | මෙහෙයුම් වියදම් වලට සාපේක්ෂව කාර්ය මණ්ඩල පිරිවැය | 20.27 | 22.14 | 51.1 | 52.1 |
| | <u>ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාත</u> | | | | |
| | පෙළ 1 | 22.96 | 22.17 | 13.5 | 16.6 |
| | <u>ද්‍රවශීලතා අනුපාත</u> | | | | |
| | ද්‍රවශීල වත්කම්/තැන්පතු | 22.82 | 23.64 | 61 | 67.2 |

බලපත්‍රලාභී විශේෂිත බැංකු අංශයට සාපේක්ෂව ශුද්ධ පොළී ආන්තිකය සියයට 1.86 කින් වැඩි වුවද, ස්කන්ධය මත ප්‍රතිලාභය පිළිගත හැකි මට්ටමක නොපැවතුණු අතර එය ආංශික අනුපාතයට වඩා සියයට 8.8 කින් පසුපසින් පැවතුණි. තවද, 2015 හා 2016 යන වර්ෂ දෙකෙහිදීම ආංශික අනුපාතයන් සමඟ සැසඳීමේදී බැංකුවේ ද්‍රවශීලතාවය වඩාත් පහළින් පැවතුණි.

### 3.3.3 බැංකුවේ වෙළඳපළ කොටස

බලපත්‍රලාභී විශේෂිත බැංකු අංශයට හා බැංකු අංශයට සාපේක්ෂව මුළු තැන්පතු හා මුළු වත්කම් මත පදනම්ව බැංකුවේ වෙළඳපළ කොටස පහත දැක්වේ.

| වර්ෂය | තැන්පතු මත පදනම් වෙළඳපළ කොටස ප්‍රතිශතයක් ලෙස | | වත්කම් මත පදනම් වෙළඳපළ කොටස ප්‍රතිශතයක් ලෙස | |
|---|---|---|---|---|
| | බැංකු අංශයේ ප්‍රතිශතයක් ලෙස | බලපත්‍රලාභී විශේෂිත බැංකු අංශයේ ප්‍රතිශතයක් ලෙස | බැංකු අංශයේ ප්‍රතිශතයක් ලෙස | බලපත්‍රලාභී විශේෂිත බැංකු අංශයේ ප්‍රතිශතයක් ලෙස |
| 2016 | 0.46 | 3.41 | 0.39 | 2.94 |
| 2015 | 0.52 | 3.64 | 0.42 | 3.10 |
| 2014 | 0.52 | 3.40 | 0.43 | 2.79 |
| 2013 | 0.51 | 3.43 | 0.45 | 2.91 |
| 2012 | 0.47 | 3.05 | 0.44 | 3.03 |
| 2011 | 0.49 | 2.94 | 0.48 | 3.04 |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

2011 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා බලපත්‍රලාභී විශේෂිත බැංකු අංශයට සාපේක්ෂව, තැන්පතු මත පදනම් වෙළඳපළ කොටස සියයට 0.47 කින් වැඩි වී තිබුණි. කෙසේ වුවද, 2015 වර්ෂයට සාපේක්ෂව එය සියයට 0.23 කින් අඩු වී තිබුණි. ඒ අතර, 2011-2016 කාල පරිච්ඡේදය තුළ බලපත්‍රලාභී විශේෂිත බැංකු අංශයට සාපේක්ෂව බැංකුවේ වත්කම් මත පදනම් වෙළඳපළ කොටස සියයට 0.10 කින් අඩු වී තිබුණු අතර, එය 2015 වර්ෂයට සාපේක්ෂව සියයට 0.16 කින් අඩු වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්ය සාධනය

#### 4.1.1 ප්‍රධාන අරමුණු ඉටුකර ගැනීම

1975 අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු නීතියේ 2(2) වගන්තියට අනුව, මෙම නීතියේ විධිවිධාන අනුව මූල්‍ය සහ වෙනත් සහායන් සැපයීමෙන් කෘෂිකාර්මික, කාර්මික හා නිවාස සංවර්ධනයට සහායවීම බැංකුවේ ප්‍රධාන අරමුණ වේ. ඒ අනුව, 2016 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා මහ බැංකුවට සපයන තොරතුරු මත පදනම්ව, එක් එක් අංශයට සපයන මූල්‍ය සහායන්ගේ විස්තර පහත දැක්වේ.

| අංශය | මුළු සහායයන්ගේ එකතුව රු."000" |
|---|---|
| කෘෂිකාර්මික හා ධීවර | 3,586,627 |
| සංචාරක කර්මාන්තය | 40,344 |
| ඉදිකිරීම් කර්මාන්තය | 24,906,652 |
| **එකතුව** | **28,533,623** |

ව්‍යවස්ථාපිත අවශ්‍යතාවයන්ට අනුකූල වීම සඳහා, බැංකුව එහි ණය වලින් සියයට 99.9 ක් ම කෘෂිකාර්මික හා නිවාස ණය ලෙස සපයා තිබුණි.

## 4.1.2 අක්‍රීය ණය (Non-performing loans)

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ලබා ගත හැකි වූ තොරතුරු අනුව, 2016 දෙසැම්බර් 31 දිනට මුළු හිඟ ණය ප්‍රමාණය රු. මිලියන 28,530 ක් වූ අතර ඉන් රු. මිලියන 7,815 ක් අක්‍රීය ණය ලෙස හඳුනා ගෙන තිබුණි. එය මුළු හිඟ ණය මුදල් වලින් සියයට 27 ක් නියෝජනය විය.

(ආ) 2016 දෙසැම්බර් 31 දිනට ප්‍රධාන අක්‍රීය ණය 08 ක වටිනාකම රු.48,462,023 ක් වූ අතර ඒ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

i. මෙම අක්‍රීය ණය 08 න් කිසිදු වාරිකයක් 2016 වර්ෂය තුළ අය කර ගෙන නොතිබූ අතර පිළිවෙලින් රු.33,302,506 ක් හා රු.2,693,389 ක් වටිනා ණය ගොනු දෙකක් විගණනයට ලබා දී නොතිබුණි.

ii. 2016 දෙසැම්බර් 31 වන විටත් රු.33,302,506 ක් වූ අක්‍රීය ණය අයකර ගැනීම සඳහා ණය ලබා ගත් අයට විරුද්ධව බැංකුව කිසිදු නීතිමය ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

## 4.1.3 බැංකුවේ ණය කළඹ

ඉකුත් වර්ෂයට සාපේක්ෂව 2016 වර්ෂය තුළ ප්‍රදානය කරන ලද විවිධ ණය හා අත්තිකාරම් පහත දැක්වේ.

| ණය වර්ගය | 2016 | | 2015 | | විචලනය (වාසි/අවාසි) |
|---|---|---|---|---|---|
| | ප්‍රදානය කරන ලද ණය සංඛ්‍යාව | වටිනාකම | ප්‍රදානය කරන ලද ණය සංඛ්‍යාව | වටිනාකම | වටිනාකම |
| | | රු.මි. | | රු.මි. | රු.මි. |
| උකස් ණය | 1,846 | 2,018 | 1,916 | 1,874 | 144 |
| සේවක අර්ථසාධක ණය | 6,238 | 1,824 | 8,031 | 2,451 | (627) |
| පුද්ගලික ණය | 6,018 | 4,441 | 5,608 | 3,503 | 938 |
| ප්‍රති මූල්‍ය ණය | 0 | 0 | 1 | 1 | (1) |
| වෙනත් ණය | 60 | 4 | 0 | 0 | 4 |
| **එකතුව** | **14,162** | **8,287** | **15,556** | **7,829** | **458** |

ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂය තුළ ප්‍රදානය කරන ලද මුළු ණය වල වටිනාකම සියයට 06 කින් වැඩි වුවද, ප්‍රදානය කරන ලද ණය සංඛ්‍යාව සියයට 09 කින් අඩු වී තිබුණි.

## 4.1.4 හිඟ ණය අය කර ගැනීම

විගණනයට සපයන ලද තොරතුරුවලට අනුව, එකතුව රු. මිලියන 4,009 ක ණය ශේෂයක් අය කර ගැනීමෙන් තොරව 2016 දෙසැම්බර් 31 දිනට වාරික 12 කට වඩා හිඟව පැවතුණි. මෙම ප්‍රමාණයෙන් රු. මිලියන 3,904 ක් උකස් ණය හා සේවක අර්ථසාධක ණය නියෝජනය විය.

**4.2 මතභේදයට තුඩු දෙන ගණුදෙනු**

**-----------------------------------------**

2016 අප්‍රේල් 29 දිනැති අංක පීඊඩී 03/2016 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ ප්‍රතිපාදනවලට අනුගත නොවී, රු.21,035,164 ක වටිනාකමක උපයන විට ගෙවීම් බදු, අදාල සේවකයන්ගේ වැටුපින් අඩු නොකර සේවකයන් වෙනුවෙන් බැංකුව විසින් ගෙවා තිබුණි.

**4.3 මානව සම්පත් කළමනාකරණය**

**------------------------------------------**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) බැංකුවේ කාර්ය මණ්ඩල තත්ත්වය අනුව, 2016 දෙසැම්බර් 31 දිනට අනුමත හා තත්‍ය කාර්ය මණ්ඩලය පිළිවෙලින් 523 ක් හා 375 ක් වූ අතර ඒ අනුව එම දිනට 148 ක පුරප්පාඩු සංඛ්‍යාවක් පැවතුණි. කෙසේ වුවද, 2016 දෙසැම්බර් 31 වන විට මුළු පුරප්පාඩු සංඛ්‍යාවෙන් 76 ක් කොන්ත්‍රාත් පදනම මත සේවයේ යොදවා තිබුණි.

(ආ) බැංකුවේ සුමට ක්‍රියාකාරීත්වයට බලපාන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී තනතුරු දෙකක් හා ප්‍රධාන කළමනාකාර තනතුරු 04 ක් ඉහත පුරප්පාඩු තුළ ඇතුළත් වී තිබුණි.

**4.4 කළමනාකරණ ක්‍රියාකාරකම්**

---------------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය සඳහා වූ අළෙවි සැළසුම තුළ ඇතුළත්, කෙටි පණිවිඩ පහසුකම් ස්වයංක්‍රීය කිරීම, වෙළඳපළ අවදානම් ශ්‍රේණිගත කිරීමේ අත්පොතක් හඳුන්වා දීම, සිත් ඇඳගන්නා රූපවාහිනී දැන්වීම් නිෂ්පාදනය, පාරිභෝගික ලේඛන ප්‍රතිනිර්මාණය වැනි වැඩසටහන් 09 ක් සමාලෝචිත වර්ෂය තුළ දී ක්‍රියාවට නංවා නොතිබුණි.

(ආ) වැඩසටහන් 21 ක් වෙනුවෙන් රු. මිලියන 17.5 ක් වෙන් කර තිබුණද, 2016 වර්ෂය අවසන් වන විට මෙම වැඩසටහන් මූලික මට්ටමේ පැවතුණි. තවද, සමාලෝචිත වර්ෂය තුළ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කළ එක් එක් වැඩසටහන වෙනුවෙන් විස්තරාත්මක අයවැයක් බැංකුවේ අළෙවි අංශය විසින් පිළියෙල කර නොතිබුණි.

**5. ගිණුම් කටයුතු භාවය හා යහ පාලනය**

**----------------------------------------------**

**5.1 අයවැය පාලනය**

**------------------**

2016 වර්ෂයේදී බැංකුව අයවැය ලේඛනය සංශෝධනය කරනු ලැබුවත්, ණය පොළී ආදායම හා කාර්ය මණ්ඩල අධ්‍යයන හා පුහුණු වියදම් වලට අදාල සංශෝධිත අයවැය සංඛ්‍යා හා තත්‍ය සංඛ්‍යා අතර ප්‍රමාණාත්මක විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායික කලමනාකරණ පාලන උපකරණයක් ලෙස යොදාගෙන නොතිබූ බව පිළිබිඹු විය.

**5.2 අභ්‍යන්තර විගණනය**

**------------------------**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අභ්‍යන්තර විගණන අංශයේ අනුමත කාර්ය මණ්ඩලය 05 කට සීමා වුවද, අභ්‍යන්තර පාලනයේ වැදගත් අංගයන් වන බැංකුවේ ආයෝජන, ණය අය කර ගැනීම, ශාඛා මෙහෙයුම් යනාදිය ආවරණය කිරීමට අභ්‍යන්තර විගණන අංශයේ සේවක සංඛ්‍යාව ප්‍රමාණවත් නොවිණි.

(ආ) 2016 ජනවාරි 01 දින සිට බැංකුවේ ප්‍රධාන අභ්‍යන්තර විගණක තනතුර පුරප්පාඩුව පැවතුණි. කෙසේ වුවද, 2017 ඔක්තෝබර් 31 වන විටත් මෙම තනතුර පිරවීමට ඵලදායී ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

**6. පද්ධති හා පාලන**

---------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු බැංකුවේ සභාපතිවරයා වෙත වරින් වර දන්වා යවන ලදි. පහත සඳහන් ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතු වේ.

| පාලන ක්ෂේත්‍රය | නිරීක්ෂණ |
|---|---|
| වෙළඳපළ කොටස පවත්වාගෙන යාම | වෙළඳපළ කොටසේ පිළිගත හැකි වර්ධනයක් නිරීක්ෂණය නොවූ නිසා ඉහළ තරඟකාරීත්වයක් පවතින බැංකු කර්මාන්තය තුළ වෙළඳපළ කොටස ඉහළ නංවා ගැනීමට හෝ පවත්වා ගැනීමට බැංකුව සතුව සැළැස්මක් තිබිය යුතුය. |
| තැන්පතු හා ණය ගිණුම්කරණය | මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති තැන්පතු හා ණය ශේෂ සහ අනුරූප වාර්තා අතර ප්‍රමාණාත්මක වෙනස්කම් නිරීක්ෂණය විය. එබැවින්, බැංකුව මෙම වෙනස්කම් අවම කර ගැනීමට ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගත යුතුය. |